# නාඋල ප්‍රාදේශීය සභාව

# මාතලේ දිස්ත්‍රික්කය

-----------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.2,076,555ක් වැඩියෙන් දැක්වීම සමුච්චිත අරමුදලට නිවැරදිව ගැලපීම් කර නොතිබුණු අතර,සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් ගිණුමේ ගෙවිය යුතු දායක මුදල රු.1,881,190ක් වැඩියෙන් දැක්වුණි.

(ආ). ලැබිය යුතු එකතුව රු.2,492,928ක් වූ කර්මාන්ත ණයගැති ශේෂයක්, ගෙවිය යුතු එකතුව රු.3,591,825ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයක් හා එකතුව රු.21,245ක් වූ වෙනත් ණයහිමි ශේෂ 3ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ). 2007 සැප්තැම්බර් මාසයේදී නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවරුම් නියෝග මඟින් සභාව වෙත පවරා දී තිබූ පර්චස් 10.56 ක් වූ ඉඩම් කට්ටි දෙකක පිරිවැය හා 2006 වර්ෂයේදී ඉදිකර තිබූ කසළ කළමනාකරණ ගොඩනැගිල්ලේ පිරිවැය සමාලෝචිත වර්ෂයේදීත් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රදානලෙස ලබාදී තිබුණු ටිපර් රථයේ හා ට්‍රැක්ටරයේ පිරිවැය ගිණුම්ගත නොකර, රු.10,178,880ක් වූ රක්ෂිත වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණු අතර, 2006 වර්ෂයේදී මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලෙස ලබාදී තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලරයේ පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි

(ඉ). ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කර්මාන්ත ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත අවස්ථා 03කදී ලබා දුන් එකතුවරු.450,800ක් වූ නොපියවූ අත්තිකාරම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් විල්ගමුව ප්‍රාදේශීය සභාවට ලැබී, එම සභාව විසින් නාඋල ප්‍රාදේශිය සභාවට ලබා දී තිබුණු ගැල්වනයිස් බට 145න් සභාව සතුව පවතින ගැල්වනයිස් බට 106හි රු.117,342ක්වූ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.50,630,707ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.476,422ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.26,297,715ක් වූ අතර, වසර 05කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.167,314ක්වූ ශේෂ 04ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 02 ක එකතුව රු.25,565,065ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ රු.214,538ක ශේෂයක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,459,005ක් වූ ගිණුම් විෂයයන් 06කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.449,747ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,987,996ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,538,249ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02ක කාලපරිච්ඡේදය තුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

(ආ). මුළු ආදායම සහ වියදම අතර අනුපාතයේ අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,889,807ක් හා වර්ෂයේ බිල්කිරීම් රු.1,673,976ක් විය. වර්ෂය තුල අයකර ගැනීම් පිළිවෙලින් රු.631,203ක් හා රු.875,810ක් විය. ඒ අනුව වරිපනම් බදු අයකර ගැනීමේ ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 33ක් හා සියයට 52ක් වූයෙන් වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

2.3.2 වරිපනම් බදු

-----------------

හිඟ හිටි වරිපනම් බදු හා අධිගාස්තු පිළිවෙලින් රු.2,056,770ක් හා රු.407,843ක් වූ අතර, හිඟ හිටි වරිපනම් බදු ශේෂය තුළ වසර 05ක කාලයක් ඉක්මවූ රු.89,482ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.3 බදු කුලී

----------

(අ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1 ජේදයේ විධිවිධාන පරිදි ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත කඩකාමර කුලී අය නොකර, මහාසභා තීරණයක් මත කඩකාමර කුලී අයකර තිබුණු අතර, ඇතැම් කඩකාමර වල බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි බදු කුලී ගිණුමේ ශේෂය රු.278,020ක් වූ අතර, එම ශේෂය තුළ ඉකුත් වර්ෂවලට අදාල රු.195,385ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.4 අක්කර බදු සහ කසළ බදු

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.23,684ක් හා හිඟ හිටි කසළ ගාස්තු ශේෂය රු.19,613ක් වූ අතර, එම ශේෂ වර්ෂ 5ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පැවතුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.442,253ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,200,000ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3.6 ප්‍රචාරන දැන්වීම් ගාස්තු

---------------------------

ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරණ දැන්වීම් පුවරු වලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ vii(ඊ) හා xxx උපවගන්ති වල විධිවිධාන පරිදි රු.138,315ක මුදලක් අයකරගෙන නොතිබුණි.

2.4 අධිභාර

----------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයකදී පනවන ලද අධිභාරයකට අදාලව රු.7,335ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 3.5 වගන්තියේ උපදෙස් පිළිපැදීමෙන් තොරව සභාව සතු නාඋල කණුමුලයාය ඉඩමෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා තම පදිංචි නිවස ඉදිකරගෙන තිබුණු අතර, වෙනත් පාර්ශවයන්ද එම ඉඩමෙහි ව්‍යාපාර පවත්වාගෙන යමින් පැවතුණු නමුත්, වගකිව යුතු නිලධාරීන් විසින් ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඊ - නැණ පියස තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේදී රු.607,617ක් වටිනා විෂයයන් 10කට අයත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 22ක් සභාව වෙත ලබාදී තිබුණු නමුත්, එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ආ). 1999 ජනවාරි 23 දින අනතුරකට පත් වී තිබුණු ඩබල් කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වැය වූ මුදලින් රක්ෂණ හිමිකම් මඟින් ආවරණය නොවූ රු.152,200ක මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කළයුතු බවට හඳුනාගෙන තිබුණු වෙළඳසැල් 609කින් වෙළඳසැල් 76ක් සඳහා පමණක් බලපත්‍ර ලබා දී තිබුණු අතර, වෙළඳසැල් 533ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කර තිබුණි. එසේ වුවද, බලපත්‍ර ගාස්තු සඳහා එම ආයතනවලින් මුදල් අයකරගෙන තිබුණි.

(ඇ). 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව, රු.378,840ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වටිනාකම රු.100,000 ක්වූ අත්ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ ජලබවුසරයක් වසර 10ක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.4 හඳුනාගත් අලාභ

--------------------

පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මඟින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ලබා දී තිබුණු ගැල්වනයිස් බට වලින් රු.40,959ක් වටිනා බට ඒකක 37ක ඌනතාවයක් විය.

3.5 අවිධිමත් ගනුදෙනු

------------------------

(අ) 2014 මැයි 05 දිනැති අංක 01/2014 දරන පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන කාර්යයන් වෙනුවෙන් රු.1,031,822ක වියදම් දරා තිබුණි.

(ආ) සභා මාර්ගයකට අවහිර වූ ගලක් කඩා ඉවත් කිරීමේදී පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සම්මත මිල ගණන් වලට වඩා රු.150,760ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

ඕපල්ගම පානීය ජල යෝජනා ක්‍රමය

-------------------------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඕපල්ගම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඕපල්ගම ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ එළඹී ගිවිසුම ප්‍රකාර වැඩ ආරම්භ කිරීම සඳහා රු.196,000ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. සමිතිය විසින් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු නමුත්, අත්තිකාරම් මුදල 2015 මාර්තු 17 දින වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරන ටොන් 02ක පමණ කසළ ප්‍රමාණයක් සේරුදණ්ඩාපොල ඉඩමට රැගෙන ගොස් කසළ වලට දමා පස්වලින් වසාදමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා කසළ වළවල් කැපීමට රු.70,000ක වියදමක් දරා තිබුණි. සේරුදණ්ඩාපොල ඉඩමෙහි කසළ කළමනාකරණය කිරීම සඳහා 2006 වර්ෂයේදී ගොඩනැගිල්ලක්ද ඉදිකර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ගොඩනැගිල්ල අදාළ කාර්යයට යොදවා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

ලිඛිත රාජකාරි පැවරීමකින් තොරව අභ්‍යන්තර විගණන අංශයට නිලධාරිනියක් පත්කර තිබුණු නමුත් එම නිලධාරිනියට වෙනත් රාජකාරිද පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු

--------------------------------------

2014 අගෝස්තු 08 දිනැති අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 04ක රු.11,910,000ක් වූ ඇස්තමේන්තුගත ආදායම්වලින් කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 09ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 1.76 සිට සියයට 82 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 17ක් සඳහා සලසාදී තිබූ රු.21,333,570ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 33ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 2 සිට සියයට 82 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). වාහන පාලනය
(ඊ). ණයගැති පාලනය
(උ) කොන්ත්‍රාත් පාලනය